

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**


| | | |
|---|---|---|
| **55 වන කාණ්ඩය** | **බු.ව. 2556 පොසොන් මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2012 ජූනි මස 04 වන දා** | **02 වන කලබ** |


# පොසොන් උදාන ගීතිකා

මිහින්තලා උදා ගිරෙන්
උදම් දහම් සඳින් පෙරෑ
කැලුම් දිගන්තයේ වැදී
පහන් කළා මෙ ලක් දනන්

වැව යි කෙත යි විහාරය යි
ලක් පොළෝ තලේ බැඳී
සාමයේ සිහිල් පවන්
හැමී සියල් සතන් නිවා

මහින්ද මා හිමින් තැනූ
ධම්මදීපය යි මෙ ලක්
රකිම්හ එක් සිතින් මෙ දිවි
සත් සිරිත් වඩා හොඳින්

**අනඳ**



# මිහිඳු මහරහතන් වහන්සේ

**අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ**
**මහානායක මාහිමියන් වහන්සේ**

බුදුන් වහන්සේ ගේ පිරිනිවියෙන් 236 වැන්නෙහි - හෙවත් මෙයින් 2250 වසකට පෙර පොසොන් පුර පසළොස්වක් දවසෙහි මිහිඳු මාහිමියන් වහන්සේ මේ සිංහලද්වීපයට වැඩම කොට බුදුසසුන් පිහිටුවූ බව කවුරුත් දනිති.

සසුන් පිහිටුවීමේ කටයුතු නිමැවූ පසු හෙවත් ත්‍රිපිටකධරයන් ඇති කිරීමෙන් පර්යාප්තිශාසනය ද , සුපිළිපන් සිවුපිරිස ඇති කිරීමෙන් ප්‍රතිපත්තිශාසනය ද, සතරමඟ සතරපල ලත් දහස් ගණන් ආර්යයන් ඇති කිරීමෙන් ප්‍රතිවේධශාසනයද යි තුන් බුදුසස්න ම මෙ ලක්දිවැ සිංහල ජනතාව කෙරෙහි මනාසේ පිහිටුවූ පසු එක්තරා දවසෙකැ දෙවනපෑතිස් රජතුමා උන්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නයක් හා එයට උන් වහන්සේ දුන් පිළිතුරත් සමන්තපාසාදිකා නම් වූ විනය අටුවා හි මෙසේ දක්වේ. (පහත දැක්වෙන්නේ එහි සිංහල පරිවර්තනයයි)

''ස්වාමීනි දන් ලක්දිවැ බුදු සස්න පිහිටියේ දෝ හෝ' යි ඇසූ කලැ 'එසේ යැ' මහරජ සස්න නම් පිහිටියේ යැ, එහෙත්, තව ම එහි මුල් නම් නො බැස්සාහ'යි වදාළ කල්හි 'ස්වාමීනි, ඉතින් මුල් බැස්සා නම් වන්නේ කවර කලෙක්හි ද' යි ඇසී යැ, එ බසට මහරජ යම් දවසෙකැ ලක්දිවැ ම උපන් මවු පිය

දෙදෙනකුන් හට ලක්දිව්හි දී ම උපන් දරුවෙක් ලක්දිවැ දී ම පැවිදි වැ ලක්දිවැ දී ම විනය බණ දහම් ඉගෙනැ ලක්දිවැ ම සිටැ ලංකාපුත්‍රයනට ඒ විනය බණ දහම් කියවා නම් පුහුණු කරවා නම් එදා මෙ රටැ බුදු සස්න මුල් බැස්සා නම් වන්නේ යැ'' යනු යි.

යම් ජාතියකගේ අවයවයක් මෙන් සැලැකියැ හැකි වන්නේ ඒ ජාතියෙහි ම වූ මවුපියන්ගෙන්, ඒ රටේ දී ම ඉපැදැ, එහි ම, ඒ ජාතියේ පිරිස අතර ම, ස්වජාතික සිරිත් විරිත් පුහුණු වෙමින් බාල්‍යයෙහි සිටැ දැනුමැති වන තෙක් වැඩුණු මිනිසෙක් මැ යි. යම් ජාතියකට හෝ රටකට හෝ දෙන දීමක් එවැන්නන් පිට ම පවරා දී ම සුස්ථිර වැ පිහිටීමටත් රටවැසි පොදු ජනයාගේ පිළිගැනීමටත් හේතු වන බව දූරදර්ශී වූ නුවණින් සලකා මේ පිළිතුර වදාළ බව සිතා ගතැ හැකි යි.

මේ ප්‍රශ්නය හා උත්තරය විමසා බලන කලැ මිහිඳු මාහිමියන් වහන්සේ බුද්ධ ශාසනය සිංහලයනට රහැන් මුදා නොමසුරු වැ ම පිරිනැමූ බවත් ගුරුමිටක් නොතබා ගත් බවත් වැටැහේ. එතෙකුදු නො වැ

''සීහළදීපං පන ආභතා'ථ
වසිනා මහාමහින්දෙන
ඨපිතා සීහළභාසාය
දීපවාසීන ම'ත්ථාය''

යන ආදී බුදුගොස් මාහිමියන්ගේ කියුම්වලින් උන්වහන්සේ මුළු තුන්පිටකයේ අටුවාවන් ලංකාවාසීන්ගේ ප්‍රයෝජනය පිණිස සිංහල භාෂායෙන් තැබූ බවත් ප්‍රකාශ වේ. මෙසේ මිහිඳු මාහිමියන් වහන්සේ සිංහල ජාතියට කිසි ම වෙනසක් නො තකා නිසැක වැ නිරවුල් වැ මුළු තුන්බුදුසස්න ම අත් මුදා (තමාගේ බැම්ම ලිහා - නොහොත් තමාගේ අත ඉවත් කොට) පවරා දෙන ගමනේ සිංහල සාහිත්‍යයට ද මහත් වූ රුකුලක්

දුන් සේක. මෙය පුදුමයෙක් නොවේ, බුදුන් වහන්සේගේ අනුශාසනය හා ආදර්ශය අනුවැ යැමෙකි. බුදුන් වහන්සේ අනෙකක් තබා, බුදු බව පවා අනුන් හා සාධාරණ වනු දක්නා කැමැති සේක. එය ද ලබාගැනීමට පැරුම් පිරීමෙහි ශ්‍රාවකයන් මෙහෙයන සේක. අන්‍ය ශාස්තෘන් හෝ ඉටුදෙවියන් මෙන් තමන්ගේ පදවිය දෙස දෘෂ්ටි හෙළනුවන් හට ශාප නොකරන සේක. එ බැවින් එබඳු ශාස්තෘවරයකු අනුගමනය කරන්නා වූ මිහිඳු මාහිමියන් වහන්සේගේ මේ ''**නොමසුරු දීම**'' ද ආශ්චර්යයෙක් නො වේ. නියම **බෞද්ධස්වභාවයෙක්** මැ යි. (''අනග්ගහිතචිත්තො දෙති'' දෙන දෙයක් නැවැතැ ගන්නා අදහසින් ලනුව අතට ගෙනැ හෝ ඒ වෙනුවට වෙන යමක් ගන්නා අදහසින් හෝ නො දී මුළුමනින් ම ලනුව අත හැරැ තමාගේ සම්බන්ධයක් අයතියක් තබා නො ගෙන දීම බෞද්ධ ස්වභාවය යි.)

මෙතෙකිනුදු නැවැත්තාහු නො වෙති. සිය සොහොවුරියන් වූ **සංඝමිත්‍රාස්ථවිරාවනුදු** ගෙන්වා සිංහල ස්ත්‍රී වර්ගයාට ද පිරිමිනට මෙන් ම සම්පූර්ණ ශාසනදායාදය ලබන්නට ප්‍රස්තාවය සැලැස්වූහ. මේ සොහොවුරු-සොහොවුරියන් දෙදෙනා වහන්සේ **සිංහලයනට ම සසුන්මෙහෙ කොට** සිංහලද්වීපයෙහි දී ම දේහත්‍යාගය කළහ (පිරිනිවන් පෑහ).

මොවුන් වහන්සේ නිසා ම, සිංහලයනට දක්ෂිණ ශ්‍රී මහාබෝධි ශාඛා - ඵලරුහබොධි සංඛ්‍යාත පාරිභොගික චෛත්‍යයෝ ද, පාත්‍රයක් පුරා සර්වඥධාතු සංඛ්‍යාත ශාරීරිකචෛත්‍යයෝ ද අත් වූහ. ශාසනික වශයෙන් අත් වූ මේ නිරාමිෂ ලාභයන් පමණක් නො වැ, මොවුන් වහන්සේගේ පියාණන් වූ **ධර්මාශෝක මහරජාණන්** මහබෝ පිරිවර ලෙස සලසා එවූ නානාශිල්පශාස්ත්‍රඥ මහාපණ්ඩිතයන් හා දක්ෂ ශිල්පීන්ගේ වශයෙන් එවකට ලොවැ පැවැති ඉතා උසස් සිප්සතර ද, බෝපුදට එවූ රජ බමුණු සිටු මහසල් කුලන්ගෙන්

එවකට ලෝමුදුන්පත් විශිෂ්ට ශිෂ්ටාචාර විශේෂයෝ ද අත් වූහ. කිසිත් බලාපොරොත්තුවක් හා නොපැටැලුණු මෙබඳු නොමසුරු පරිත්‍යාගයෝ බාහිර ශාසනයන්හි නම් නැත්තාහු මැ යි.

බමුණෝ ඔවුන් ගේ වෛදික ක්‍රියාවන් ගේ භාරය කිසි කලෙකත් නොබමුණු කිසිවකුටත් පවරා නො දෙති. වෙන සමයයන්හි පූජකයෝ ද එසේ ම වෙති. අනෙක් රටවල් තබා මෙරට ම ගෙනැ සිතා බලමු. මිහිඳු මාහිමියන් වහන්සේ මෙහි වැඩම කළ අළුතැ ම සසුන් පිහිටු වූ අනතුරු වැ ම ලංකා ශාසනය සිංහලයනට ම නිසැක වැ නිරවුල් වැ පැවැරූ නමුත් මෙරටැ පිහිටි සියවස් ගණන් ඉක්මූ අන්‍යසාමයික ශාසනයන්ගේ කෘත්‍යභාරය එක්තරා ලෙසෙකින් තවමත් පිටරට මැ යැ. ඔවුනතර සෛවරී වැ ආගමික කෘත්‍යභාරයෙහි ප්‍රමුඛ වන්නට සම්පූර්ණ නිදහස් බල ඇති සිංහල පූජකවරු තව ම ඇත් ද යි නො දනුමු. එය මිනිස්වගකට **ආගම අතින්** තිබියැ යුතු වූ සාධාරණ නිදහසටත් අභෙදචින්තාවටත් කැළැලෙක් නොවන්නේ ද?

බුද්ධාගමයෙහි නම් ශාස්තෘන් වහන්සේට මන්ත්‍ර පිරුවමින් ගී ගයමින් යදිමින් යාගහොමාදී පුදවලක්කම් ඔප්පු කිරීමක් නැති බැවින් පූජකයෝ නැත්තාහ. ගිහි පැවිදි කවුරුත් 'ශ්‍රාවකයෝ' මැ යි, වදාළ පරිදි තම තම හට අයත් පිළිවෙත් පුරමින් ශාස්තෘන් වහන්සේ ගේ වචනයට ඇහුම්කම් දෙන්නවුන් වන බැවිනි. ('කීවා අසන්නා' යනු ශ්‍රාවකශබ්දයාගේ නිර්වචනාර්ථය යි.) එයින් පැවිද්දෝ ගිහියනට වැඩි ගුණ සිල් ඇත්තවුන් බැවිනුත් ධර්මයෙන් අනුශාසනා කිරීමෙන් ගුරුතන්හි සිටියවුන් බැවිනුත් ''**පූජ්‍යයෝ**'' නම් වෙති. ''පිදියැ යුත්තෝ සැලැකියැ යුත්තෝ'' යනු එහි අර්ථය යි. ''**පූජකයෝ**'' නම් පුදන්නෝ යි පූජා ඔප්පු කරන්නෝ යි. බුදුන් වහන්සේට මල් පහන් ආදියෙන් පුදා ගරු බුහුමන් දක්වනු කැමැති ගිහි වූ හෝ පැවිදි

වූ හෝ කාහට වුව ත් කෙළින් ම එය කරන්නට ඉඩ තිබේ. බුදුන් වහන්සේටත් වැසියාටත් මැදි වැ සිටැ පූජා ඔප්පු කරන **තේවාකාරයෙක්** (පූජකයෙක්) වත්, ''අසුවල් අසුවල් දෙයින් මෙතෙක් මෙතෙක් වුවැ මනා යැ'' යි මල් වට්ටි කිරිබත් බඳුන් ආදී පිදියැ යුතු දේවල නියමයෙක් වත් බුද්ධාගමයෙහි නැත්තේ යැ. ''**තේවා**'' යන මේ ශබ්දය ම සිංහල නො වේ. පාළිත් නො වේ. දෙමළෙන් බැහැ වැටුණු වහරෙකි. දේවාලයයන්හි දෙමළ කපුවන් මගින් සිංහලයට බැහැ වැටුණු **භ්‍රෂ්ටශබ්දයෙකි.** පාළියෙන් හෝ සංස්කෘතයෙන් ''**සේවා**'' යි ව්‍යවහෘත වූ ශබ්දය මේ දෙමළ වූ සැටි යි. ඉතින්, සේවාව නොහොත් සේවය නම් පඩියකට හෝ අණසකකට යටත් වැ යම් බලාපොරොත්තුවක් ඇති වැ කැරෙන මෙහෙයක් මිස, තමාගේ භක්තිප්‍රබෝධයෙන් කැරෙන පූජාවක් නොවන බව වැටැහියැ යුතු යි. බුද්ධ ගෞරවයෙන් භක්ති ප්‍රබෝධයක් හැටියට මල් පහන් ආදිය පිදීමෙහි අනුසස් ඇත්තේ යැ, චිත්තප්‍රසාදය නිසා යැ. එහෙත්, ඒ පුද පිළිගැනීමට බුදුන් වහන්සේ මෙහි නැත්තාහ, පිරිනිවන් පෑ බැවිනි. උන්වහන්සේ පිරිනිවන් පානා ඇඳෙහි ද **අන්තිම මෙහොතෙහිත්** ආනන්ද ස්ථවිරයනට වදාළේ ''ආනන්දය, නුඹලා මාගේ මේ ශරීරයට මල් පහන් ආදී ආමිෂයෙන් පුද කිරීමෙහි ව්‍යාපෘත (මිඩංගු) නො වියැ යුතු යැ, එහෙත්, හැමට උතුම් පූජාව වූ **ප්‍රතිපත්තියෙන්** මාගේ ධර්මකායයට පුද කරව්'' යනු යි. එ හෙයින් දේවදෘෂ්ටිකයන්ගේ දේවාලයයන්හි කපුවන් මෙන් තේවාවෙහි යෙදුණු පූජකයෝ සියම් බුරුම ආදී ථෙරවංසික විභජ්ජවාදය පවත්නා රටෙකැ වත් ත්‍රිපිටකයෙහි ආ එක ම පදයෙකැ වත් නො පෙනෙති.

''සංඝරාජ-මහානායක-දිසාපාලකාදි'' පදවි පවා ලක්දිවැ පොළොන්නරු කාලයෙන් මෙ පිටැ පිරිස පාලනය කිරීමේ පහසුව පිණිස ඒ ඒ පෙදෙස්හි සංඝයාගේ සම්මුතියෙන් පනවා ගත් ප්‍රඥප්තිමාත්‍ර යි. එ හෙයින්, සියම් සංඝරාජයන් සියම්සඟන

විසිනු ත් බුරුම සංඝරාජයන් එරටැ සඟන විසිනුත් සිංහල සංඝරාජාදීන් සිංහල සංඝයා විසිනුත් තෝරා සම්මත කිරීම බෞද්ධයන් අතරැ පැවැතෙන චාරිත්‍රය වේ.

මෙසේ ලෝකයෙහි නා නා සාමයිකයන් දෙස බලන කලැ මිහිඳු මාහිමියන් වහන්සේ ගේ යට දක්වූ ''නොමසුරු දීමෙහි'' උතුම්කම වැඩි වැඩියක් ම වැටහේ. එබැවින් උන්වහන්සේ ලංකාවතරණය කළ මේ පොසොන් පුණු පොහෝදා උන් වහන්සේගේ ගුණාතිශයය සිහි කොට කෘතඥ වීම් වශයෙන් පුණ්‍යෝත්සවයෙහි යෙදීම සකල සිංහල බෞද්ධයන්ගේ සත්පුරුෂ ගුණයෙකි. උන් වහන්සේට කටැ යුතු වූ උසස් ම පූජාව නම් උන් වහන්සේ ගෙන'වුත් මෙහි පිහිටුවූ බුදුසස්න කළු සුදු ආදී ජාති භේද කුල භේදා දී අළුත් රජසින් නො කෙලෙසියැ දී ඒ පිහිටුවා වදාළ පරිදි ම පිරිසුදු වැ සාධාරණ වැ පවත්නා සේ රැකැ බලා ගැනීම මැ යි.

**සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා**

''ඇඟ වැස්මෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ නෙරුමෙන් රෙදි ඇඳ නොම ගන්නේ
හිස වැසුමෙන් කිසි තැන නො වදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ

ඇඳුමට වැඩි වියදම් නො කරන්නේ
වැඩි කොට ඇඳුමුත් ඇඳ නොම ගන්නේ
ගමනට ගෙදරට එක නාඳින්නේ
වයසට පමණට ඇඳුම් අඳින්නේ

**සිරිත් මල්දම**

ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා



# මා පිය ගුණ මහිම
# බුදු මුවින්

**පූජ්‍ය කටුකුරුන්දේ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ**

''මහණෙනි, දෙදෙනකුට කළගුණ සැළකීම පහසු නැතැයි කියමි. කවර දෙදෙනකුට ද? මවට හා පියාට ය. ''

සියක් වසකට ආයු ඇති, සියක් වසක් ජීවත්වන පුතෙක් තම එක් උරහිසක මවත්, අනෙක් උරහිසෙහි පියාත් හිඳුවාගෙන, තම සිරුර මතම මළ මුත්‍ර පහකරන ඔවුනට නැහැවීම්, ඇඟ ඉලීම්, අෑ සිරුර පිළිදැගුම් කරමින් ගෙන යයිද, එතෙකිනුදු , මහණෙනි, මාපියනට උපකාර කළා හෝ සෑහෙන පමණ කළා හෝ නොවේ.

මහණෙනි, යමෙක් තම මාපියන් සත්රුවනින් පිරුණු මේ මහපොළොවෙහි අධිපති කොට රජ ඉසුරු පවරා දෙයි ද, එතෙකිනිදු මාපියනට උපකාර කළා හෝ සෑහෙන පමණ කළා හො නොවේ.

ඒ කවර හෙයින් ද? මහණෙනි, මා - පියෝ දරුවනට බොහෝ උපකාර කළෝ වෙති. දරුවන් ඇති කළෝ, දැඩි කළෝ, මෙලෝ දක්වාලූවෝ ඔවුහු ය.

එසේ ද වුවත්, මහණෙනි, යමෙක් ශ්‍රද්ධාව නැති තම මවුපියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි යොදවයි ද, රඳවයි ද,

පිහිටුවාලයි ද, දුශ්ශීල මවුපියන් ශීලසම්පත්තියෙහි යොදවයි ද, රඳවයි ද, පිහිටුවාලයි ද, ප්‍රඥාව නැති මවුපියන් ප්‍රඥා සම්පත්තියෙහි යොදවයි ද, රඳවයි ද, පිහිටුවාලයි ද, මසුරු මවුපියන් ත්‍යාග සම්පත්තියෙහි යොදවයි ද, රඳවයි ද, පිහිටුවාලයි ද, එතෙකින් ම මහණෙනි හෙතෙම මවුපියනට උපකාර කළේ ද වේ. සෑහෙන පමණ කළේ ද වේ. පමණට වඩා කළේ ද වේ.

මවුපියනට අත්-පා මෙහෙවර කිරීමෙන් හෝ රජ සැප දීමෙන් හෝ ගෙවා ගත නොහැකි ණයක්, ඔවුන් තුළ ශ්‍රද්ධාව, ශීලය, ත්‍යාගය හා ප්‍රඥාව යන ගුණ ධර්ම වඩාලීමෙන් ගෙවා ගත හැකි බව මේ බුදුවදනින් හෙළි වේ.

**සසර දුක් කෙළවර කර නිවන් සුව ලබාගැනීමට උපකාර වන මේ ගුණධර්ම සතර තුළින් තම මවුපියන්ට උපස්ථාන කරනු කැමති දරුවෝ, පළමුවෙන් ම තමන් තුළ මේ ගුණ ධර්ම දියුණු කරගැනීමට උනන්දු වෙත්වා !**

**(අංගුත්තර නිකාය, එකක නිපාත, සමචිත්ත වග්ග)**



# නීති ගරුක වෙමු

## සිරිත් මුතුහර - 02

**'ගුරු සීයා' විසිනි**

සමාජය යහ මඟට පැමිණවීම සඳහා, යහපත් මාර්ගයෙහි රැඳවීම සඳහා උපයෝගි කැර ගන්නා අණ පනත් සමූහය නීතිය නමින් හඳුන්වනු ලැබේ.

මිනිසා ශිෂ්ට මාර්ගයෙන් බැහැර ව ක්‍රියා කරන විට එය වැළැක්වීම සඳහා නොදනුම්වත් කමින් මාර්ග නීතිය වැනි දෙයක් කඩ කළත්, සමාජයේ පිළිගත් සමාජ විරෝධී ක්‍රියාවන් කරන්නේ නැත. නීති ගරුක ව වාසය කිරීම ශිෂ්ටත්වයේ එක් වැදගත් ගුණාංගයකි.

බුද්ධ ශාසනය තුළ සංඝ සමාජය ඇති වූ පසු (බුද්ධත්වයෙන් වසර විස්සක් ගිය තැන) වැරදි කරන භික්ෂූන් සඳහා ශික්ෂාපද පනවන්නට බුදුරජාණන් වහන්සේ ට සිදු විය. එතෙක් සංඝ සමාජය නිර්මල ස්වරූපයෙන් පැවැතිණි. සංඝ සමාජයේ නිවැරැදි පැවැත්ම, සංඝයා ගේ පහසුව, ශාසනය බොහෝ කල් පැවැත්වීම යන ආදි කරුණු දහයක් මුල් කැර ගෙන ශික්ෂාපද පනවන ලද බව විනය පිටකයෙහි සඳහන් වේ.

ගිහියනට ශීලය වශයෙන් මූලික ශික්ෂාපද පහක් අයත් වේ. ' පන්සිල් ' යන නමින් හඳුන්වන්නේ ඒවා ය. පන්සිල් යනු මානව සමාජයේ මූලික මිනිස් දහම් පහකි. ඒවා කඩ කරන

විට පුද්ගලයන් අතර වියවුල් ස්වභාවයක් ඇති වේ. තමා ගේ සිත් සතන් තුළ ද කිලිටි වීමක් සිදු වේ.

නීතිය ශීලයක් හැටියට ආරක්‍ෂා කිරීම සමාජයට බෙහෙවින් වැඩ දායක ය. නීතිය රකින මිනිසුන් සිටින සමාජය සදාචාර සම්පන්න ය, විනීත ය, එහි ඇත්තේ ඔවුනොවුනට ප්‍රසන්න වූ පරිසරයකි. ශ්‍රී ලංකාවෙහි ද එබඳු සමාජ පරිසරයක් තිබුණු බව පැරැණි දේශාටකයන්, යුරෝපීය වියතුන් ලියූ පත පොතින් එළිදරවු වේ.

එදාට වඩා අද අපේ සමාජය හාත්පසින් වෙනත් වී ඇත. ප්‍රභූ සමාජයේ සිට ම දූෂණ - වංචා - සොරකම් බහුල ව පෙනෙන්නට ඇත. සාමාන්‍ය සමාජයේ මිනිසුන් ගැන කවර කතා ද? මහ පාරේ මිනිසුන් එන යන සැටි, එකිනෙකා පරයා හඹා යමින් කැරෙන රිය පැදවීම් දකින කවර විදේශිකයකුට වුව ද මෙය නීතියක් රීතියක් නැති රටක් බව ඒත්තු යනු ඇත. මිනිසුන් ගේ මේ පිරිහීම් ස්වභාවය රටේ සංවර්ධනයට බාධාවකි. මිනිසුන් නො හදා රට හදන්නට යෑමේ අනිටු විපාක නුදුරු අනාගතයෙහි දී අප රට තුළ වඩාත් ප්‍රකට ව දකින්නට ලැබෙනු නිසැක ය.

නීති ගරුක සමාජයක් හැදීමේ කාර්යය ගෙදරින් ආරම්භ කළ යුතු ය. දෙමවුපියන් ආදර්ශවත් ව ඊට නිසි මඟ පෙන්වීම කළ යුතු ය. දෙවනු ව අධ්‍යාපනයෙන් එය ප්‍රබල ලෙස ශක්තිමත් කළ යුතු ය. හැදියාව පිළිබඳ ව බුදු සමයෙන් මූලික ව අවධාරණයක් කැර ඇතත් මේ බුදුනු රටට වඩා එම හැදියාව, එම විනය ජපානය වැනි ආසියාතික රටවල හා බොහෝ යුරෝපාදි රටවල අධ්‍යාපනය තුළින් ක්‍රියාත්මක වන අයුරු දකින විට අප රට පිළිබඳව ඇති වන්නේ බලවත් සංවේගයකි.

මෙය ලියන ලේඛකයා වරක් ඇමරිකාවේ වෙසෙන සිංහල පවුලක් සමඟ එහි වනෝද්‍යානයක් බැලීමට ගියේ ය. අතරමඟ වෙළෙඳ සංකීර්ණ රිය නැවතුම් පළක වාහනය නතර කැර වාකවුළු පහත හෙළා කිසියම් දෙයක් මිල දී ගැනීම පිණිස පවුලේ දරුවන් ගේ පියා වෙළෙඳ සංකීර්ණයට ඇතුළු විය. වාහනය ඇතුළේ සිටි මව වාහනයේ සී.ඩී. යන්ත්‍රය ක්‍රියාත්මක කළා ය. එයින් පිට වූයේ උස් නාදයක් සහිත සංගීතයකි. ඒ පවුලේ සිටි අවුරුදු හතක් පමණ වයසැති කුඩා දරුවා සැණින් පහත දමා තිබුණු වා කවුළු වීදුරු ඉහළට දැම්මේ ය. ඒ වාහනයේ ශබ්දය එළියේ සිටින අයට කරදරයක් වේ යැයි සිතුණු නිසා ය. එ රට අධ්‍යාපන ක්‍රමයෙන් එ බඳු හික්මීමක් ලබා දෙන බව මව මා සමඟ කීවා ය.

අධ්‍යාපනයේ අරමුණ දැනුම, ආකල්ප, කුශලතා දරුවාට ලබා දීම යැයි කීවත් ඉහත සඳහන් කළ ආකාරයේ ආකල්ප අපේ පාසලින් කොතරම් වර්ධනය වේ දැයි සිතා බැලිය යුතු ය. බටහිර අධ්‍යාපන රටාවෙහි දැන් පිළිගෙන ඇති '' අධ්‍යාපනයෙන් උසස් මිනිසකු බිහි කිරීමේ '' බෞද්ධ පරමාර්ථය අප රටේ අධ්‍යාපනයෙනුත් ක්‍රියාත්මක කිරීමට වගකිව යුත්තන් නො සිතන්නේ නම් දැනුමින් හිස පිරුණු, නීතියට පිටුපා ක්‍රියා කරන අසංවර, අවිනීත අනාගත පරපුරක් මේ රට තුළ, නුදුරු අනාගයෙහි බහුල ව ව්‍යාප්ත වනු නො වැළැක්විය හැකි ය.



# අලස නො වෙමු අනලස් වෙමු

කොස්ගම බොල්ලතාව ශ්‍රී සුභද්‍රා දහම් පාසලේ උප ප්‍රධානාචාර්යානී
**ශාස්ත්‍රපති එච්. එම්. සුජාතා නාලිනි මහත්මිය විසිනි.**

යකඩය මිනිසාට බොහෝ සෙයින් ප්‍රයෝජන වුවත් , එය මල බැඳෙන්නට ඉඩ හැරියොත්, එයින් ප්‍රයෝජනයක් ගත නොහැකි වන්නා සේ අපේ ජීවිතයෙන් ද නිසි කල, නිසි ලෙස, නිසි ඵල නොගත්තොත් අපේ ජීවිතයේ සියලු දියුණුව විනාශ වී යයි.

එසේ ජීවිතය විනාශ කරන ජීවිතයට බැඳෙන මල වර්ග 4ක් ගැන බුදුපියාණන් වහන්සේ දේශනා කළා. ධම්මපදයේ මල වර්ගයේ එන පරිදි ජීවිතයට බැඳෙන ඒ මල වර්ග නම් උගත් ශිල්ප ශාස්ත්‍ර නිතර නිතර සිහි නොකිරීම, ගෘහ කටයුතුවල දී වීර්ය නොකිරීම, ශරීර වර්ණය කෙරෙහි සැළකිලිමත් නොවීම හා යමක් ආරක්‍ෂා කිරීමට ප්‍රමාද වීමයි.

මේ කරුණුවලින් පැහැදිලිවන ආකාරයට ම අප ගේ ජීවිතයේ සියලු අභිවෘද්ධිය විනාශ වන්නේ අප ගේ අලසකම හේතුවෙන් . එසේ නම් අනලස්ව කටයුතු කළහොත් නොලද හැකි දියුණුවක්, ආලෝකයක් නොමැති බව අප මෙහි දී තේරුම් ගත යුතු යි.

පාසල් දරුවකු නම් ඔහු තමා උගත් ශිල්ප ශාස්ත්‍ර නිතර නිතර ප්‍රගුණ කළ යුතුයි. වැඩිවියට පත් වූ දිනෙක උගත්

ඒ සිප්සතරවල කුශලතා යළි යළිත් මතුකරගෙන දෛනික ජීවිතය ආලෝකවත් කරගත හැකි යි. පිරිනිවන් මඤ්චකයේ වැඩ සිටින බුදුරදුන් දැක පුහුදුන් භික්ෂූන් වහන්සේ හඬා වැලැපෙද්දී ධර්මාරාම තෙරුන් වහන්සේ, පසෙකට වී භාවනා වඩමින් ධර්මාවබෝධය ලබා ගැනීමට උත්සාහ කළේ, බුද්ධ පරිනිර්වානයට පෙර තමන්ගේ පැවිදි ජීවිතයේ පරමාර්ථය සපුරා ගැනීමටයි. උන්වහන්සේ අනලස් ව වීර්යය වැඩූ නිසා උන්වහන්සේ ගේ අදහස සාර්ථක වුණා. අපත් අප ගේ කටයුතුවල දී අනලස් විය යුතු බවයි මෙයින් ප්‍රකට වෙන්නේ.

උට්ඨාන වීර්යයෙන් හීනවීමත් ජීවිතයට බැඳෙන තවත් මලක්. උත්සාහය මිනිස් ජීවිතයේ අර්ථය සපුරාලීමට අවශ්‍ය ම කරුණක්. නිදිගත් සිංහයා ගේ කටට මුවන් නොපනින බව අප දන්නා දෙයක් . සිංහයා සිය ගොදුරු ලබා ගන්නේ මානය අල්ලා, ඉලක්කය බලා සතුරා වෙතට පැනීමෙන් . එවන් උත්සාහයක් නොගත්තොත් සිංහයාට සැමදාම ඉන්නට වෙන්නේ කුස ගින්නෙන්. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ උතුම් වූ බුද්ධ රාජ්‍යයට පැමිණ වදාළේ, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පාරමිතා ධර්ම පුරමින් කළ නොපසුබස්නා උත්සාහය නිසා. උත්සාහය මෙලොව ජීවිතය ආලෝකවත් කර ගැනීමට හේතුවන සම්පතක් බවයි බුදුරදුන් දීඝජානු කෝලිය බමුණාට වදාළේ. කුම්භඝෝෂක, චුල්ලසෙට්ඨි ආදී කතාවලින් උගන්වන්නේ උට්ඨාන වීර්යයෙන් යුත් පුද්ගලයන් යසසට කීර්තියට පත් වන බවයි. එනිසා ගිහියන් වන අප අපේ ජීවිතයේ සෑම අවස්ථාවක දී ම අපට නියමිත කටයුතුවලදී අනලස් වීමට උත්සාහවත් විය යුතු ය.

කුසීතකම ශරීර වර්ණයට බැඳෙන මලක්, නැතිනම් කිලුටක් බවත් බුදුරදුන් පෙන්වා වදාළා. දෛනික ජීවිතයේ දී ශරීර වර්ණය පැහැපත්ව තබා ගත යුතු බවයි ඉන් අවධාරණය

වන්නේ. බිම්බිසාර රජතුමා සිදුහත් තාපසයා කෙරෙහි පැහැදුණේ උන්වහන්සේ ගේ ශරීර වර්ණය දැකීමෙන්. උපක ආජීවකයා බුදුරදුන් කෙරෙහි පැහැදුණේ ශරීර වර්ණය දැකී-මෙන්. උපතිස්ස පරිබ්‍රාජකයා අස්සජී තෙරුන් වහන්සේ දැකීමෙන් පැහැදුණෙත් උන්වහන්සේ ගේ ඉතා ප්‍රසන්න ශරීර වර්ණය කෙරෙහි. තත්කාලීන සමාජයේ විවිධ ව්‍රත සමාදන් වෙමින් දුටුවන්ට ප්‍රිය නොවන ශරීර වර්ණ ඇති අය අතරින් ඉතා පැහැපත් ශරීර වර්ණයකින් යුක්තව සිටි බුදුරදුන් ඇතුළු සංඝ සමාජයට බොහෝ අය ප්‍රියා කළා. බුදුරදුන් භික්‍ෂූන්ට දේශනා කර වදාළේ, ''**අප්පසන්නානං පසන්නාය, පසන්නානං භියෝභාවාය**'' කියා අප්‍රසන්න වූ අය පැහැදෙන, පැහැදුණු අය වඩාත් පැහැදවීම පිණිස දිවි ගෙවන්න කියා. ඒ නිසා අපත් අපගේ බාහිර අලංකරණයන් සමඟ ම අභ්‍යන්තර වශයෙන් ද ජීවිතය ගුණදහමින් සරසා ගන්නට අනලස් විය යුතු ය.

ආරක්‍ෂා කරගත යුතු දේ ආරක්‍ෂා කර ගැනීම කෙරෙහි ප්‍රමාද වීමත් ජීවිතයට බැඳෙන කිලුටක් බවයි, බුදුරදුන් දේශනා කර වදාළේ. උට්ඨාන වීර්යයෙන් යුතුව දහඩිය මහන්සියෙන් උපයා සපයා ගත් ගේ දොර, වතුපිටි, මිලමුදල්, ඇඳුම් පැළැඳුම්, පොතපත ආදී මේ හැම දෙයක් ම හොඳින් රැකබලා ගැනීමට අනලස් විය යුතුයි. '**නට්ඨං න ගවෙස්සති**'' විනාශවන දේ පිළිබඳව නො සෙවීම ජීවිතයේ පරිහානියට හේතුවන බවයි, බුදුරදුන් වදාළේ. අප ජීවත්වන දූෂිත සමාජය තුළ අප තුළ වැඩුණු බොහෝ යහගුණ දම් පාපමිත්‍රාදීන් වැනි අය නිසා විනාශයට පත්වීම වැළැක්විය නොහැකි යි. එබඳු අවස්ථාවල අප කල්පනාකාරී විය යුතු යි. මෙත් කරුණා මුදිතාදී යහගුණ වැනසී ඊර්ෂ්‍යා මදමානාදී අගුණ වැඩීගෙන එන බව හැඟේ නම් කල්‍යාණ මිත්‍රයන් හමුවී විනාශ වන යහගුණ වඩා ගැනීමට දිරිමත් විය යුතු වෙනවා.

අප බොහෝවිට වරක් දෙවරක් කිසියම් කටයුත්තක් සඳහා උත්සාහවී එය අසාර්ථක වූ විට උදාසීන වී එය අත්හැර දැමීමට

පෙළඹෙනවා. ඒ දේ කෙරෙහි නොසැලකිලිමත් වෙනවා. මේ නොසැලකිලිමත් බව හෙවත් ප්‍රමාදය බුදු දහමේ දක්වෙන්නේ ජීවිතයට බැඳෙන මලක් වශයෙන්. කිලුටක් වශයෙන්. ප්‍රමාදයට බුදු උතුමන් නිග්‍රහ කළා. **(පමාදෝ ගරහිතෝ සදා)** අප්‍රමාදී බව ප්‍රශංසා කළා. **(අප්පමාදං පසංසන්ති)** අනලස්ව, අප්‍රමාදීව කටයුතු කරන වීර්යවන්තයාට සාර්ථක නොවන දෙයක් නම් නැති බවයි, බුද්ධ දේශනාව වන්නේ. **(විරියවතෝ භික්ඛවේ කිං නාම න සිජ්ඣති)**

එසේනම් අපිත් අප කවර ජීවිත කාලයක සිටියත් අපට පැවරී ඇති ඒ ඒ කටයුතුවල නිරතවීමේ දී අලස් බවේ විපාක දැක, අනලස් වීමේ ආනිශංස දැන මෙලොව පරලොව ජීවිතය සාර්ථ කර ගනිමින් උතුම් වූ ලෝකෝත්තර සුවය ද සලසා ගැනීම සඳහා අප්‍රමාදීව කටයුතු කරමු.

**ඔබ සැමට තෙරුවන් සරණයි !**

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

## කිරීමට පහසු අයහපත සහ කිරීමට අපහසු යහපත.

ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය හක්මන සුමනසිරි හිමි

අයහපත්, නරක ක්‍රියා පෞද්ගලික ව තමාටත්, පොදුවේ සමාජයටත් සිදු කරන්නේ මහත් විපතකි. තමා හා සමාජයේ අයහපතට, පිරිහීමට හේතු වන එම ක්‍රියාවන් සිදු කිරීම පහසු කාර්යයකි. අනාදිමත් කාලයක පටන් අපේ සිත නැඹුරුව පවතින්නේ අයහපත් දේ සිදු කිරීම සඳහා ය. යහපත් දෙයක් කිරීම සඳහා සිත යොමු කිරීම මහත් ආයාසයෙන් කළ යුත්තකි. මේ නිසා තමාගේත් සමාජයේත් යහපතට, දියුණුවට හේතු වන දේ සිදු කිරීම අතිශයින් ම දුෂ්කර වන්නේ ය. තමාගේ යහපත සඳහා මෙන් ම, පොදුවේ සමාජයේ යහපත සඳහා අවශ්‍ය පියවර ගන්නේ ජාතිහිතෛෂී හා පරහිතකාමී සත්පුරුෂයන් විසිනි. සත්පුරුෂ පුද්ගලයා දෙලොව දියුණුව පිණිස ඉතා දුෂ්කර වූ යහපත් ක්‍රියාවල යෙදෙයි.

**සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච**
**යං වේ හිතං ච සාධුං ච - තං වේ පරම දුක්කරං**



# පොසොන් උදානය

**ආචාර්ය එච්. ඒ . පී. අභයවර්ධන සූරීන් විසිනි.**

පොසොන් උදාවයි - මිහින්තලාවයි
සදහම් සිසිලයි - ගුණදම් වහරයි
ලලිත කලාවයි - හෙළ බොදු දහරයි
මිහිඳු සමින්දේ - ඔබ ගුණ සිහිවෙයි

මිස්සක පව්වෙදි - වූ පෙළහරෙකි
යළි සිහි ගැන්වෙන - පුන් පොහො දිනෙකි
හෙළ දිව හෙළි කළ - මාහිමි ගුණයට
හෙළ බොදු බැති නතු - වන තුම් මඟුලකි
පොසොන් උදාවයි - මිහින්තලාවයි //

පැණ විසදාලූ - නැණවත් නිරිඳූ
ගුණ ගඟ සනහා - මාහිමි මිහිඳූ
බැති කුසුමන් පුද - නුරපුර කැන්දූ
සදහම් මිහිරේ - සිරිලක රැන්දූ
පොසොන් උදාවයි - මිහින්තලාවයි //

මිහින්තලාවයි - අනුරාපුරයයි
සසුනට පුද කළ - මහමෙවුනාවයි
බොදු ගුණ ගැඹරයි - පිවිතුරු දිවියයි
පොසොන් උදාවයි - මිහින්තලාවයි

සිතිවිලි මිහිරේ - තෙරුවන් ගුණ වේ
පිවිතුරු තිදොර ම - සංවර ගති වේ
දහමින් ඔදවත් - වූ මගෙ මව් බිම
අනුබුදු හිමිගේ - ගුණයට පුද වේ
පොසොන් උදාවයි - මිහින්තලාවයි

රුවන්වැලිය - සිරිමා බෝ සමිඳූ
සමාධි බුදුරුව - මෙත් ගුණ විහිදූ
ලකඟන උරුමය - බොදු දන පිබිදූ
සමරමි නමදිමි - මාහිමි මිහිඳූ
පොසොන් උදාවයි - මිහින්තලාවයි



# හැදෙන ගහ
# දෙ පෙත්තෙන් දැනෙයි

**අතිපූජ්‍ය**
**පැළෑණෙ සිරි වජිරඤාණ මහා නායක මාහිමියන් විසිනි**

ළමයිනි, මේ කදිම කීමෙකි. අතරමඟ දී නො මැරී සාරවත් වැ හැදෙන ගහ පෙති දෙකේ පැළෑටිය කාලයේ දී ම හඳුනා ගත හැකි ය. නොලෙඩ වැ නො මැලැවී, බිඳ ගෙන කන පණුවන් නැති වැ පොහොණී වැ හැදෙන බව පෙනෙන හෙයිනි. එසේ මඃ

හැදෙන ළමයා ද ළපැටි සුරතල් ළදරු කල්හි ම හඳුනා ගත හැකි ය. සිනා මුහුණින්, නොමැලවුණු නොලෙඩ ශරීරයෙන්, නොකිපෙන කීකරු පැවැත්මෙන්, අත තුබූ දෙයක් දෙනු කැමැති ත්‍යාගී අදහසින්, ලෝකයාට පතුරුවන මෛත්‍රියෙන් නරක ළමයින් ගෙන් ඈත් වැ හොඳ ළමයින් ගේ යාළුවකු වීමෙන් කඩිසර හුරු බුහුටි නිතර ම නොදන්නා යමක් උගන්නා කැමැති ප්‍රශ්නකරන නොමුලු ගැන්නෙන බියසුලු නොවන තියුණු නුවණැති පෙම්බර පැවැත්මෙන් හැදෙන ළමයා කුඩා කල්හි ම හඳුනා ගත හැකි ය.

ඉතින් ඔය ළමයා ත් එසේ ම වන්නට උත්සාහ කරන්න.

**වැඩි වැඩ හැර දමා - නියම වැඩෙහි ම යෙදෙමින්**
**මතු දියුණුව බලා ගෙන - හැසිරෙවු කදිම ළමයිනි**



# සෙන් කතා දෙකක්

**එච්. එම්. මොරටුවගම සූරීන් විසිනි**

සෙන් ආචාර්යවරයාගේ කාර්යය ශිෂ්‍යයා උන් මාර්ගයෙන් සන් මාර්ගයට ගැනීම ය. එහිලා දීර්ඝ බණ දේශනා ඔහු අනුගමනය නො කරයි. මෙරමාගේ චර්යාව කෙරෙහි සූක්ෂ්මාත්මාවබෝධයක් ලත් විචක්ෂණ සෙන් ආචාර්යවරයා ඒ සඳහා අතිශය සංක්ෂිප්ත මාර්ගයක් අනුගමනය කරයි. මතු දැක්වෙන කතා පුවත් ඒ බැව් අපට හඬගා කියයි.

''සෙන්ගායි වෙත භාවනා ඉගෙන ගනිමින් සිටි සිසුන් අතුරින් එක් අයෙක් මැදියම් රැයෙහි පිබිදී පන්සලේ තාප්පයෙන් පැන විනෝදයට නගරයෙහි ඇවිදීමට පුරුදු ව සිටියේ ය.

එක් රැයක් සෙන්ගායි, ගෝලයන් ගැන පරීක්ෂා කරන විට මොහු ඇඳෙහි නො සිටි බවත්, උස කනප්පුවක් තබා තාප්පයෙන් පැන ගොස් ඇති බවත් දැන ගත්තේ ය. සෙන්ගායි කනප්පුව ඉවත් කොට තාප්පය ළඟ වාඩි වී සිටියේ ය.

ගමන නිම කොට පෙරළා පැමිණි ගෝලයා කනප්පුව යැයි සිතා ගුරුවරයාගේ හිසේ පය තබා තාප්පයෙන් පැන ගත්තේ ය. තමා කෙළේ කුමක් දැයි දැන ගත් විට හෙතෙම බෙහෙවින් තැති ගත්තේ ය.

''උදේ පාන්දර හරියට පින්න, පරෙස්සම් වෙන්න. හෙම්බිරිස්සාව හැදෙන්න පුළුවන්''යී ගුරුතුමා පැවසී ය. ගෝලයා ඉන්පසු කිසි දිනෙක රෑ ඇවිදින්නට නො ගියේ ය.

සැඩ පරුෂ සොරකු දැහැමි පුද්ගලයකු බවට පත් කරගනු ගැබූ පුවතක් සෙන් කතා අතර දක්නට ලැබෙයි. බුදුරජාණන් වහන්සේ ගේ 'පුරිසදම්මසාරථී' ගුණය අපේ සිහියට නඟන ඒ පුවත ද සෙන් ආචාර්යවරුන් විසින් අනුදත් ශික්ෂණ මාර්ගය මනා ව විදහා දක්වයි.

'එක් සැන්දෑවක ශිෂිරි කෝජුන් පිරිත් සජ්ඣායනා කරමින් සිටින විට තියුණු කඩුවක් රැගෙන හොරෙක් පැමිණ, ''හොඳ හිතින් තමුසේ ළඟ තියෙන මුදල් දෙනවා, නුදුන්නොත් මරනවා '' යි තර්ජනය කෙළේ ය.

ශිෂිරි සිටි පියවරෙහි ම නො සැලී සිට මෙසේ තෙපළේ ය.

''මට කරදර කරන්න මහන්සි වෙන්න එපා. අර ලාච්චුවේ සල්ලි ඇති ගන්න'' යි පැවසූ හේ නැවත වරක් පිරිත් සජ්ඣායනය ඇරඹී ය. මඳ වේලාවක් පිරිත් සජ්ඣායනා කළ ශිෂිර නිහඬ ව සිට සොරා ඇමතී ය.

''සල්ලි ඔක්කොම ටික නො ගත්තොත් හොඳයි. හෙට වරිපණම් බදු ගෙවන්නත් තියෙනවා. ඒකට කීයක් හරි ඉතිරි කළොත් ලොකු උදව්වක්.''

සොරා කිසිදු කතාවක් නොමැති ව මුදලින් කොටසක් පොදි බැඳගෙන යන්නට පිටත් විය.

ශිෂිර : තෑග්ගක් ලැබුණහම දුන්න මනුස්සයට ස්තුතියක් කරන්න පුරුදු වුණොත් ඒක

බොහෝම හොඳ චාරිත්‍රයක්!

හොරා : කළ උදව්වට බොහෝම ස්තුතියි !

සොරා එතැනින් බැහැර ව ගියේ ය.

ටික දිනකට පසු ඔහු පොලිස් අත්අඩංගුවට ගනු ලැබිණි. පොලිසිය වෙත තමා කළ සියලු හොරකම් පිළිබඳ පාපොච්ඡාරණයක් කළ හේ ශිෂිර කෝජුන්ගෙන් ගත් මුදල් ගැන ද සඳහන් කෙළේ ය. එම නිසා ඔහුට විරුද්ධ නඩුවෙහි සාක්කිකරුවකු වශයෙන් ශිෂිර ද උසාවිය වෙත කැඳවනු ලැබිණි.

මගේ හිතේ හැටියට මේ මනුස්සයා හොරෙක් නෙමෙයි. මමයි ඒ මනුස්සයට සල්ලි දුන්නේ. ඒ මනුස්සයා කට පුරා ස්තුතියකුත් කරලයි ගියේ''

ශිෂිරි කෝජුන්ගේ සාක්කිය එපමණි.

හොරා හිරගෙට නියම විය. හිර ගෙදරින් නිදහස ලබා පිටත් වූ හේ ශිෂිරි වෙත පැමිණියේ, ගෝලයකු වී භාවනා පුහුණු වීමට පටන් ගත්තේ ය.''



# බෞද්ධ ළමයා උපදේශන මණ්ඩපය

**'විදසුන්' විසිනි**

ගැටලුව :

අධ්‍යාපන කටයුතුවලට භාවනාව වැදගත් වන බව නිතර අසන්නට ලැබෙනවා. එය ඇත්තක් ද? අධ්‍යාපන කටයුතුවලට බාධා නොවී ගැලපෙන පරිදි භාවනා කරන්නේ කෙසේ ද?

පින්වත් දුවේ පුතේ, අධ්‍යාපන කටයුතුවලට භාවනාව වැදගත්වන බව නිතර ගුරුවරුන්, වැඩිහිටියන්, ස්වාමීන් වහන්සේලා ප්‍රකාශ කරනවා. ඇත්තටම භාවනාව අධ්‍යාපන කටයුතුවලට ගැලපෙන්නේ කෙසේ ද කියා විමසීමත් අධ්‍යාපන කටයුතුවලට බාධා නොවී භාවනාව කරන ආකාරය දැන ගැනීමත් ඉතාම වැදගත්.

දුවේ, පුතේ වතුර බොර වූ කුණු පිරුණු විලක් සිහිපත් කර ගන්න. එහි වතුර අඳුරු පාටයි. බොරවෙලා තැන තැන කුණු පාවෙනවා. එවැනි විලක පතුල බලන්න බැහැ. පතුලේ මැණික් ආදී වටිනා දේ තිබුණත් පෙනෙන්නේ නැහැ. සුදුවැලි, බෝල බෝල ගල්, ලස්සන මාළු පෙනෙන්නේ නැහැ. ඒත් වතුර හොඳට නිසල වූ විලක් සිහිපත් කර ගන්න. වතුර නිසල වූ විට මඩ කැළඹෙන්නේ නැහැ. විල පුරා ම හොඳට විනිවිද දකින්න පුළුවන්කම ලැබෙනවා. හරිම සුන්දරයි.

දුවේ පුතේ අපේ සිතත් විලක් වගෙයි. ඒ සිත් විලේ රාග (ආශාව) දෝස (තරහව) මෝහ (මුළාව) කියන කුණු මඩ ආදිය

තිබෙනවා. භාවනා නොකර සිටින විට ඒවා කැළඹෙනවා. ආශාව වැඩියි. තරහව වැඩියි. මෝඩකම වැඩියි. එවිට අපේ සිතින් ලෝකයේ විවිධ දේවල් විනිවිද දකින්න බැහැ. අපේ මනසේ වටිනාකම් මතු කර ගන්න බැහැ. ඒක හරියට බොර වූ විලක් වගෙයි. අපි කොච්චර අලුත් දේවල් ඉගෙන ගත්තත් ඒවා අපේ මනසේ හොඳින් ධාරණය වෙන්නේ නැහැ. මැණික් වගේ සැඟවී තිබෙන වටිනා මතකයන් එළියට එන්නේ නැහැ. එහෙත් භාවනාවකින් සිත නිසල කරන විට එය හොඳට පැහැදිලි වෙනවා. ප්‍රභාශ්වර වෙනවා. ඒක හරියට නොකැළඹුණු විනිවිද පෙනෙන විලක් වගෙයි. විලක් නිසල වන විට කුණු මඩ ආදිය පතුලේ තැන්පත් වෙනවා වාගේ භාවනා කරන විට අපේ සිතේ ආශාව, තරහව, මුළාව වගේ කෙලෙස් මුල්ලකට යටපත් වෙනවා. සිත පිරිසිදු වෙනවා. ඒ පිරිසිදු සිතින් ලෝකය විනිවිද දකින්න පහසුයි. අලුත් දැනුම සොයන්න පුළුවන් වෙනවා. දැනුම් මතකයන් හොඳින් අවශ්‍ය වෙලාවට මතු වී එනවා. ඒ අනුව භාවනාව ඉගෙනීමට හොඳ අත්වැලක් වෙනවා.

සවසට බුද්ධවන්දනා කරලා ටික වේලාවක් නමුත් භාවනාවක් වැඩීමෙන් හොඳට සිත සංසුන් වෙනවා. රාත්‍රී නින්දට පෙරත් උදෑසන අවදි වූ විටත් සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා, කියා ලෝකයටම මෙත් වැඩීමෙන් හැම දෙනාත් සමඟ සමගියෙන් සිනහ සපිරුණු මුහුණින් කටයුතු කළ හැකි වෙනවා. ආනාපාන සති භාවනාව ආදිය ටික ටික නමුත් පුරුදු කරන විට සිත හොඳට තැන්පත් වෙනවා. දූල පුතාලගේ යහපත් අරමුණු කරා යන්න සිත ඔබට හොඳට උදව් කරනවා.

බළංගොඩ ආනන්දමෛත්‍රෙය මහනාහිමියන්, මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන්, රේරුකාණේ චන්දවිමල මහනාහිමියන්, අරීසෙන් අහුබුදු, ඊ.ඩබ් අදිකාරම් වැනි මහා පඬිවරු ජීවිතයේ හැමදාම භාවනාව පුරුදු කළ උතුමන්. අපේ දූ පුත්තු භාවනාව ජීවිතයට හුරු කොට ලෞකික ලෝකෝත්තර දෙලොව දියුණුව ඇති කර ගනිත්වා !



# ARAHAT MAHA MAHINDA – THE RADIANT LIGHT OF THE POSON MOON

Compiled by
**Srima Warusawithana** - Calgary, Canada

A visitor like no other came to Lanka our Island Home,
Garbed in saffron robes ;arahatMahinda, son of great Asoka
Emperor of the vast kingdom of ancient India – Jambudipa;
With a retinue of noble ones, brought the teachings of the Buddha,
Gift from a friend to a friend – the noblest of gifts
The gift of the Dhamma…
KingDevanampiyatissa beloved of the gods,
That festive day out on a hunting spree in the forest
Put down his bow and arrows – gazed at the saintly form
Atop the mountain peak of Mihintale“ who art thou that calls me Tissa ?
I am the King of Lanka and no one calls me by my name”
Mahinda though son of a mighty King, a prince, heir to all Jambudipa,
In strange and humble manner answered thus :
“A disciple am I – of the king of the Dhamma – Lord Buddha.
Out of compassion for you and all your countrymen,
I bring this day - the worthiest of gifts - the noble Dhamma,
Perfect in the beginning, perfect in the middle and so also in the end;
The King was intent to hear; but ArahatMahinda mused:
“Would this King be wise enough to understand, to comprehend the Dhamma?”
So, to test this ability – simple questions posed the sage to the King
The answers sound and most correct.
ArahatMahindaconvinced now that here was a king who would understand
The noble and gentle teachings of the Buddha.
We, the people of Lanka rejoice today, the day we inherited
The legacy of the B’s teaching, when the radiant moon shone full
Upon the mountain peak of Mihintale.